**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 12 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කඹුරුපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1. ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණු ගෙවිය යුතු වියදම් හා ප්‍රාග්ධන වැඩ සඳහා ගෙවීමේදී ණයහිමි ශේෂයෙන් අඩුකර දැක්වීම නිසා රු.1,823,033 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) එකතුව රු.3,839,060 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.3,630,533 ක් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

#### 1.3.2 අවිනිශ්චිත ගිණුම

නිරවුල් කිරීමට පියවර නොගෙන ඉකුත් වර්ෂවල සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් පවතින රු.1,168,845 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ඊට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද පියවර ගෙන නොතිබුණි.

### 1.3..3 නොසැසඳු පාලන ගිණුම

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.83,641,807 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.51,798,054 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට කාල විශ්ලේෂණ හඳුනාගත නොහැකි එකතුව රු.40,343,327 ක් වූ විවිධ ණයගැති ශේෂ සහ එකතුව රු.41,307,925 ක් වූ ණයහිමි ශේෂ පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ආයුකාලය හඳුනාගත නොහැකි එකතුව රු.4,821,869ක් වූ තැන්පතු ශේෂ පැවතුණි.

(ඇ) එකතුව රු.431,338 ක් වූ කිරින්ද-පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ ණය ගිණුම අවුරුදු 10 ක කාලයක් තිස්සේ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

--------------------------------------------

එකතුව රු.98,986,426 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීනව සහ විධිමත්ව පැවැත්වූ ස්ථාවර වත්කම් ලේඛනය, ඉන්වෙන්ට්‍රි ලේඛනය හා වාර්ෂික සමීක්ෂණ වාර්තා, එකතුව රු. 247,320 ක් වූ තොග ශේෂ සම්බන්ධයෙන් යාවත්කාලීන කල තොග ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා, එකතුව රු.3,131,673 ක් වූ හිඟ ආදායම්, එකතුව රු.40,343,328 ක් වූ ණය ශේෂ, රු.40,789,698 ක් වූ කර්මාන්ත හා සැපයුම් ණයහිමි ශේෂ,රු.43,338 ක් වූ ලැබිය යුතු අත්තිකාරම්,එකතුව රු.3,029,968 ක් වූ තැන්පතු 06 ක් සම්බන්ධයෙන් උපලේඛන, උපයෝගී ලේඛන,කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එම ගනුදෙනු හා ශේෂ සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට විගණනයේදී නොහැකි විය

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,884,716 ක් වූ අතර, ඊට අනුරූපීව

ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.7,129,576 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,755,140 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 79 ක් ඉක්ම වූ මුළු පුනරාවර්තන වියදම් පැවතුණි.

(ආ) ස්වයං උත්පාදිත ආදායම ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැලකිය යුතු ඉහළ අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී ඇති අතර, ස්වයං උත්පාදන ආදායම් මගින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ණයගැති ශේෂය තුළ සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළ රු.40,343,227 ක ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර සහ රු.16,922,635ක ලැබිය යුතු මුද්දර ගාස්තු පැවතීමෙන් ජංගම හා ක්ෂණික අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 වරිපනම්

ආරම්භක හිඟය රු.810,892 ක් වූ අතර, රු.921,678 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.1,732,570 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.875,659 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.856,911 ක හිඟ ශේෂයක් පැවතුණි.

### 2.4.2 අක්කර බදු

ආරම්භක හිඟය රු.304,981 ක් වූ අතර, රු.24,628 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.329,609 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.13,713ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.315,896 ක් හිඟව පැවතුණි.

### 2.4.3 කුලී ආදායම්

ආරම්භක හිඟය රු.1,065,382 ක් වූ අතර, රු.5,894,777 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු. 6,960,153 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.5,965,921 ක් වූයෙන්, වර්ෂය අවසානයට හිග ශේෂය රු.994,238 ක් විය.

### 2.4.4 බලපත්‍ර ගාස්තු

ආරම්භක හිඟය රු.79,095 ක් වූ අතර, වර්ෂය තුළ රු.1,135,862 ක බිල්කිරීම් සමඟ රු.1,214,952 ක් අයවිය යුතුව තිබුණි.

### 2.4.5 ජල ගාස්තු

ආරම්භක හිඟය රු.2,396,656 ක් වූ අතර, වර්ෂයට අදාළ බිල්කිරීම් රු.3,796,034 ක් සමඟ රු.6,192,690 අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.4,288,801 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.1,903,890 ක් තරම් ඉහළ හිඟ ශේෂයක් පැවතුණි. ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන ජල ව්‍යාපෘති 06 ක නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.3,610,254 ක් සභා අරමුදලින් වියදම් කර තිබුණි.

### 2.4.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.16,982,635 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.778,697 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 3.1.1 මානව සම්පත් කළමනාකරණ

ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් පිරවීමට මෙන්ම 36 ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

### 3.1.2 සේවක ණය

නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.165,301 ක් වූ ණය ශේෂ පැවතියද, ඒවා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මින් රු.62,126 ක ශේෂයක් වර්ෂ 05 ක කාලයක සිටද, තවත් රු.103,175 ක ශේෂයක් වර්ෂයකට වැඩි කාලයක සිටද අය නොවී පැවතුණි.

## 3.3 කොන්ත්‍රාත් පාලනය

ගනේගම බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ ප්‍රමාදය වෙනුවෙන් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර රු.177,129 ක ප්‍රමාද ගාස්තු අයකර ගෙන නොතිබුණි.

## 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ කසළ එකතු කිරීම සඳහා රු.6,174,314 ක වියදම් දරා තිබුණද, එකතු කරන ලද කසළ නගර මධ්‍යයේ අවිධිමත් ලෙස බැහැර කිරීම නිසා විවිධ ගැටළු මතුවී තිබුණි. 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති පාරිසරික පනතේ විධි විධාන ප්‍රකාරව, සභාව විසින් පරිසර බලපත්‍රයද ලබාගෙන නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවර්ධනය වෙනුවෙන් දෙන ලද රු.1,000,000 ක මුදලින් පැරණි කාර්යාල ගොඩනැගිල්ලේ වහල අලුත්වැඩියා කර තිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ ලේඛනයේ ඇතුළත් ආදායම් විෂයයන් 02 ක ළඟා කර නොගත් ඉලක්කගත ආදායම රු.3,878,203 ක් වූ අතර, වියදම් විෂයයන් 07 ක එකතුව රු.6,255,743 ක් වූ ඉතිරිවීම්ද, වියදම් විෂයයක අනුමත සීමාව ඉක්මවා රු.71,698 ක් වියදම් දැරීම්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධානයන් සහ දකුණු පළාත් පාළන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. සභාව විසින් පත් කර තිබූ අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී රු.441,578 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලනය

----------------------

පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් රැස්කිරීම

(ඈ) අයවැය පාලනය